ජාතික ඖෂධ නියාමන අධිකාරිය

තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය දරන තනතුරු වන අතර ස්ථාන මාරු වීම් රහිත වේ.

01. සංවර්ධන නිලධාරී තනතුර : (පුරප්පාඩු ගණන 03යි)

සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් උපාධියක් ලබා තිබීම.

- අණුක ජීව විද්‍යා/අණුක ජීව (Molecular Biology) හෝ වෙනත් ජීව විද්‍යා අංශයෙන් විද්‍යාවේදී විශේෂ උපාධියක්

  හෝ

  අණුක ජීව විද්‍යා/අණුක ජීව (Molecular Biology) ජීව රසායන විද්‍යා විෂයයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය (පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව)
- රසායන විද්‍යා අංශයෙන් විද්‍යාවේදී විශේෂ උපාධියක්

  හෝ

  රසායන විද්‍යා විෂයයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය (පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව)
- ඖෂධවේදී ජන සන්නිවේදන (විශේෂ) උපාධිය

වයස : අවු. 22ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය.

තනතුරට අදාළ වැටුප් පියවර : කළමනාකරණ චක්‍රලේඛ 02/2016 පරිදි MA 3-2016 (32,200-10X445-11X660-10X730-5X730-54,060) වැටුප් පරිමාණයේ මිම් වැටුප් පියවර හා අනුමත දීමනා

බඳවා ගැනීමේ ක්‍රමවේදය : ලිඛිත තරග විභාගයක් මගින් හා/හෝ එම තනතුරුවලට අදාළ සුදුසුකම් සපුරා ඇති අය අතරින් වඩාත් සුදුසු ලෙස තෝරාගත් අය සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ලිඛිත තරග විභාගය සඳහා වන විෂය නිර්දේශය

(අ) භාෂා ප්‍රවීණතාව

(ආ) අභියෝගතා පරීක්ෂණය

(ඇ) තනතුරට අදාළ වන පරිදි විෂය දැනුම

(අ) **භාෂා ප්‍රවීණතාව** :- ප්‍රජානනය, අවබෝධය, අන්තර් විනයසය සහ සරල ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ හැකියාවන් මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

(ආ) **අභියෝගතා පරීක්ෂණය** :- සිය තනතුරෙහි කාර්ය භාරය ඉටු කිරීම පිණිස අපේක්ෂකයා තුළ පවත්නා අභියෝගතාව සහ හැකියාව මෙමඟින් පරීක්ෂා කෙරේ.

(ඇ) **තනතුරට අදාළ වන පරිදි විෂයය දැනුම** :

අදාළ තනතුරට සුවිශේෂ විෂයය සම්බන්ධව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම අරමුණයි.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2020.08.07

02. තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුර : (පුරප්පාඩු ගණන 01යි)

සුදුසුකම් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය පහ (05) මට්ටමට නොඅඩු මට්ටමේ (NVQ 5) සිවිල් තාක්ෂණික ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වයස : අවු. 18ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය.

තනතුරට අදාළ වැටුප් පියවර කළමනාකරණ චක්‍රලේඛ 02/2016 පරිදි MA 2-2-2016(30,310-10 X 300-7X350-4X600-20X710-52,360) වැටුප් පරිමාණයේ මිම් වැටුප් පියවර හා අනුමත දීමනා

බඳවා ගැනීමේ ක්‍රමවේදය : ලිඛිත තරග විභාගයක් මගින් හා/හෝ එම තනතුරුවලට අදාළ සුදුසුකම් සපුරා ඇති අය අතරින් වඩාත් සුදුසු ලෙස තෝරාගත් අය සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ලිඛිත තරග විභාගය සඳහා වන විෂය නිර්දේශය

(අ) භාෂා ප්‍රවීණතාව

(ආ) අභියෝගතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම

(ඇ) තනතුරට අදාළ වන පරිදි විෂය දැනුම

(අ) **භාෂා ප්‍රවීණතාව**:- ප්‍රජානනය, අවබෝධය, අන්තර් විනයසය සහ සාමාන්‍ය ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

(ආ) **අභියෝගතා පරීක්ෂණය** :- තනතුරට පැවරෙන කාර්යයන් මනාවින් ඉටුකිරීමෙහිලා අපේක්ෂකයා තුළ ඇති අභියෝගතාව හා තුලනාත්මකව වර්තමාන තත්ත්වයන් පිළිබඳව ඔහුගේ දැනුම ද පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

(ඇ) **තනතුරට අදාළ වන පරිදි විෂයය දැනුම** :

තනතුරට අදාළ වන පරිදි අදාළ විෂයය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2020.08.11

03. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) : (පුරප්පාඩු ගණන 18යි)

සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අධ්‍යාපන සුදුසුකම්

පරිගණක වදන් සැකසුම් (යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඊ හා සමාන මට්ටමේ නිපුණතාවයක්.

වයස : අවු. 18ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය.

තනතුරට අදාළ වැටුප් පියවර : කළමනාකරණ චක්‍රලේඛ 02/2016 පරිදි MA 1-1-2016 (27,910-10X300-7X350-4X495-20X660-48,340) වැටුප් පරිමාණයේ මිම් වැටුප් පියවර හා අනුමත දීමනා

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් මගින් හා/හෝ එම තනතුරුවලට අදාළ සුදුසුකම් සපුරා ඇති අය අතරින් වඩාත් සුදුසු ලෙස තෝරාගත් අය සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ලිඛිත තරග විභාගය සඳහා වන විෂය නිර්දේශය

(අ) භාෂා ප්‍රවීණතාව

(ආ) අභියෝගතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම

(ඇ) පරිගණක පරීක්ෂණය

(අ) **භාෂා ප්‍රවීණතාව** :- ප්‍රජානනය, අවබෝධය, අන්තර් විනයසය සහ සාමාන්‍ය ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

(ආ) **අභියෝගතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම** :- තනතුරට පැවරෙන කාර්යයන් මනාවින් ඉටුකිරීමෙහිලා අපේක්ෂකයා තුළ ඇති අභියෝගතාව හා තුලනාත්මකව වර්තමාන තත්ත්වයන් පිළිබඳව ඔහුගේ දැනුම ද පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

(ඇ) **පරිගණක පරීක්ෂණය** :- තොරතුරු තාක්ෂණයට අදාළ මූලික සංකල්ප සහ පරිගණක භාවිතයට අදාළ විවිධ භාවිතාවන් සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම සහ හැකියාව මැන බැලීම සඳහා වන පරීක්ෂණයකි.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2020.08.04

** කළමනාකරණ සහකාර තනතුර සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් රු.1,000ක මුදලක් ජාතික ඖෂධ නියාමන අධිකාරිය නමින් ලංකා බැංකුවේ රිජන්ට් වීදි ශාඛාවේ ගිණුම් අංක 78088835 දරන ගිණුමට බැර වන පරිදි ගෙවිය යුතු අතර, අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නොගැලවෙන සේ ඇළවිය යුතුය.

වෙනත් කරුණු :-

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මනාවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

iv. අදාළ තනතුර සඳහා වන මූලික සුදුසුකම් අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට සම්පූර්ණ කර තිබිය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.
- ජාතික ඖෂධ නියාමන අධිකාරිය පහත සඳහන් ලිපිනයෙහි පමණක් පිහිටුවා ඇති අතර, ශාඛා කාර්යාල නොමැත.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියමිත දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

සභාපති,

ජාතික ඖෂධ නියාමන අධිකාරිය.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

.... තනතුර සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම :-
2. මුලකුරු සමඟ නම :-
3. ලිපිනය :-
4. පදිංචි දිස්ත්‍රික්කය :-
5. උපන් දිනය :-
6. වයස :- අවු........ මාස .... දින ....
7. ස්ත්‍රී පුරුෂ භාවය :-
8. ජාතික හැඳුනුම්පත් අංකය :-
9. විවාහක/ අවිවාහක බව :-
10. දුරකථන අංකය :- ස්ථාවර .... ජංගම ....

    විද්‍යුත් තැපැල :-
11. අධ්‍යාපන සුදුසුකම් :-
12. වෘත්තීය සුදුසුකම් :-
13. පළපුරුද්ද :-
14. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක හා ලිපිනයන් :-

මෙහි ඉහතින් දක්වා ඇති මා පිළිබඳ තොරතුරු මාගේ දැනීම, විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය

____

(ඉල්ලුම්කරුගේ අත්සන)

සැළකිය යුතුයි :-

අදාළ ආකෘතියට අනුව පමණක් අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවිය යුතු අතර, ඔබගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍රවල පිටපත් අයදුම්පත්‍රය සමඟ යොමු කළ යුතු වේ.